www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 15 S

# ක්‍රිස්තියානි ධර්මය

නම ................................................ කාලය පැය දෙකයි

උපදෙස් : ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්ණයකට ලකුණු 02 බැගින් හිමිවේ.
අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දෙවියන් වහන්සේ මිනිසා මවන ලද්දේ,
    1. දෙවන දින ය. 2. හතරවන දින ය. 3. පස්වන දින ය. 4. හයවන දින ය

02. දෙව්පියා දවාල පාලනය කිරීම සඳහා මැවූ දෙය වන්නේ,
    1. හිරු ය. 2. සඳ ය. 3. වළාකුළු ය. 4. තරු ය

03. මැවීම පිළිබඳ බයිබලයේ සඳහන් පොත වන්නේ,
    1. නික්ම යාම ය. 2. උත්පත්ති ය. 3. මතෙව් ය. 4. ගීතාවලිය ය.

04. ජේසුස් වහන්සේගේ උපත දේව දූතයා මුලින් ම දැනුම් දෙනු ලැබුවේ,
    1. ශාස්ත්‍රවන්තයන්ට ය 2. හෙරොත්ට ය
    3. එඬේරුන්ට ය. 4. සිමියොන්ට ය.

05. ජේසුස් වහන්සේ වයස දොළහේ දී ජෙරුසලම් දේව මාළිගයට දෙමාපියන් සමඟ ගියේ,
    1. පෙන්තකොස්ත මංගල්‍යයට ය. 2. පාස්කු මංගල්‍යයට ය.
    3. කූඩාරම් මංගල්‍යයට ය. 4. කැපකිරීමේ මංගල්‍යට ය.

06. දෙවියන් වහන්සේ ආදි මව්පියන් පදිංචි කළ උයන වන්නේ,
    1. ගෙත්සෙමන උයන ය. 2. ඔලිව් උයන ය.
    3. මල් උයන ය. 4. ඒදන් උයන ය.

07. ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යාමට සහය වූයේ,
    1. සීමොන් ය. 2. අරමාතියේ ජොසප් ය.
    3. ජුදස් ඉස්කාරියොත් ය. 4. කිරේනියේ සීමොන් ය.

08. මිසර දේශයේ වහලුන්ව සිටි ජනතාව මුදා ගැනීමට දෙවියන් වහන්සේ තෝරා ගත්තේ,
    1. ආරොන් ය. 2. ජොෂුවා ය. 3. මෝසෙස් ය. 4. නාදාබ් ය.

09. කිතුනු දරුවෙකු වර්ධනය නොකළ යුතු ගුණාංගය වන්නේ,
    1. ප්‍රේමය ය. 2. වෛරය ය. 3. ඉවසීමය ය. 4. බෙදා ගැනීම ය.

10. ජේසුස් වහන්සේගේ ප්‍රධානත ම ශ්‍රාවකයා වනුයේ,
    1. ජොහන් ය. 2. ජුදස් ය. 3. පේදුරු ය. 4. අන්ද්‍රෑ ය.

(ලකුණු 2 x 10 = 20)

Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!



agaram.lk

- 11 සිට 15 දක්වා ප්‍රකාශන නිවැරදිව යා කරන්න.

| | | |
|---|---|---|
| 11. | ශාස්ත්‍රවන්තයින්ට මඟ පෙන්වූයේ | දෙවියන් වහන්සේ ය. |
| 12. | ජේසුස් වහන්සේගේ ශරීරය තැම්පත් කිරීමට සොහොන ලබා දුන්නේ | බෙත්ලෙහෙමේ දී ය. |
| 13. | ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූයේ | අරමාතියේ ජෝසෙප් ය. |
| 14. | මැවුම්කරුවාණන් ලෙස හඳුන්වන්නේ | පාස්කු ඉරිදා ය. |
| 15. | ජේසු බිළිඳු උපත ලැබුවේ | වල්ගා තරුව ය. |

(ලකුණු 2 x 5 = 10)

- අංක 16 - 20 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

16. ජුදෙව් ව්‍යවස්ථාව අනුව වසර 12 දී පිරිමි දරුවෙකු වැඩිහිටියෙකු ලෙස පිළිගනී. (.........)

17. කමාව දීම දේව දරුවෙකු සතු ගුණාංගයකි. (.........)

18. දෙවියන් වහන්සේ මැවීම දින පහක් තුළ සිදුකෙරිණි. (.........)

19. දෙමව්පියන්ට කීකරුව ජේසුස් වහන්සේ නාසරෙත් නුවර ජීවත් වූ සේක. (.........)

20. ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසුවේ මහ බ්‍රහස්පතින්දා ය. (.........)

(ලකුණු 2 x 5 = 10)

Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



II - කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු සපයන්න.

1. දෙවිපියා මැවූ දේවල් දෙකක් ලියන්න.
2. දේව දරුවෙකු සතු ගුණාංග දෙකක් ලියන්න.
3. ජේසු කුමරු බැලීමට ශාස්ත්‍රවන්තයන් ගෙනා පඬුරු දෙකක් ලියන්න.
4. කුරුසිය පාමුල දී ජේසුස් වහන්සේට අපහාස කළ කණ්ඩායම් දෙකක් ලියන්න.
5. ජේසුස් වහන්සේගේ සොහොන වෙත ගිය කාන්තාවන් දෙදෙනෙකු ලියන්න.
6. ජේසුස් වහන්සේ අපවත්වන විට පැවසූ දෙය කුමක් ද?
7. දෙවිපියා මැව් ස්ත්‍රිය හා පුරුෂයාගේ නම ලියන්න.
8. ඔබට දෙවියන් වහන්සේගෙන් ලැබී ඇති තලෙන්ත දෙකක් ලියන්න. (ලකුණු 2 x 8 = 16)

02. 1. දේව නිර්මාණයේ මුදුන් මල්කඩ ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ල. 02)

2. මිනිසා විසින් පරිසරය විනාශ කරන අවස්ථා තුනක් ලියන්න. (ල. 03)

3. කිතුනු දරුවෙකු වන ඔබ පරිසරය ආරක්ෂා කරන ආකාර 6 ක් ලියන්න. (ල. 06)

03. 1. මරියතුමියට සුබ ආරංචියක් ගෙනා දේව දූතයා කවු ද? (ල. 02)

2. ජේසු කුමරු හඳුනා ගැනීමට දේව දූතයා දුන් සලකුණ කුමක් ද? (ල. 03)

3. නත්තල සඳහා ඔබ කරන දේවල් හයක් ලියන්න. (ල. 06)

04. 1. ජේසු කුමරු දේව මාළිගයේ නැවතී කළේ කුමක් ද? (ල. 02)

2. ජේසු කුමරු සොයා පැමිණි මරියතුමියට එතුමා දුන් පිළිතුර ලියන්න. (ල. 03)

3. ඔබ දේව සබඳතාවය වර්ධනය කරගන්නා ආකාර තුනක් ලියන්න. (ල. 06)

05. 1. ජේසුස් වහන්සේ කුරුසිපත් වූයේ ඇයි? (ල. 02)

2. කුරුසපත් වීමට පෙර ජේසුස් වහන්සේට විඳීමට සිදුවූ පීඩාවන් තුනක් ලියන්න. (ල. 03)

3. ඔබ කර ඇති පව් උදෙසා කමාව යදිමින් කරන යැදුමක් ලියන්න. (ල. 06)

06. 1. කිතුනු අප පාස්කුව ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ල. 02)

2. ජේසුන් වහන්සේ දර්ශනය වූ අවස්ථා තුනක් ලියන්න. (ල. 03)

3. කිතුනු සුභාරංචිය අන් අයවෙත ගෙන යාමට ඔබට කළ හැකි දේවල් හයක් ලියන්න. (ල. 06)



agaram.lk
Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!

# පළමු වාර පරීක්ෂණය - 2019
# ක්‍රිස්තු ධර්මය (පිළිතුරු පත්‍රය)

## 6 ශ්‍රේණිය

I - කොටස

01. (4) හයවන දිනය
02. (1) හිරු ය
03.(2) උත්පත්තිය
04. (3) එඬේරුන්ට ය
05. (2)පාස්කු මංගල්‍යයට
06.(4) ඒදන් උයන ය
07. (4) කිරේනියේ සීමොන්ය
08. (3)මෝසෙස්ය
09.(02) වෛරයය
10. (3) පේදුරුය
11. වල්ගාතරුව
12. අරමාතියේ ජෝසෙප්ය
13. පාස්කු ඉරිදාය
14. දෙවියන් වහන්සේය
15. බෙත්ලෙහෙමේදීය
16. ✓
17. ✓
18. ×
19. ✓
20. ×

(ලකුණු 2 x 20 = 40)

II - කොටස

01. 1. ඉර, හඳ, අහස, පොළව වැනි පිළිතුර
2. ඉවසීම, ප්‍රේමය, බෙදා ගැනීම ආදිය
3. රත්තරන්, තුවරලා හා ගන්ධ රස ආදියෙන් දෙකක්
4. නායක පූජකයන්, ප්‍රජා මූලිකයන් හා විනයධරයන්
5. මග්දලාවේ මරියා, ජෝවන්නා, ජාකොබ්ගේ මව වූ මරියා
6. "ඒලි ඒලි ලාමා සබත්තානි" මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත් හැරියේ මන්ද
7. ඒව හා ආදම්ය
8. සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

02. 1. මිනිසා
2. ගස් කොළන් කැපීම, පිරිසිදු ජලයට කැළිකසල දැමීම, පොලිතින්, ප්ලාස්ටික් වැනි දේවල් පරිසරයට දැමීම ආදිය
3. ගස් කොළන් නොකැපීම, කුණු කසල නිසිලෙස බැහැර කිරීම, ජල සම්පත සුරකීම ආදිය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

03. 1. ගාබ්‍රියෙල් දේව දූතයා
2. "රෙදි වලින් ඔතා ගවයින් කන ඔරුවක බාවා ඇති බිළිඳකු"
3. නත්තල් ගස සෑදීම, ගවලෙනක් සෑදීම, දිව්‍ය පූජාවට සහභාගී වීම, අසරණ අයට උදව් කිරීම වැනි පිළිතුරු

04. 1. පඬිවරුන් සමඟ වාද විවාද කිරීම
2. "ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?"
3. යාච්ඤා කිරීම, බයිබලය කියවීම, ඉරිදා දිව්‍ය පූජාවට සහභාගී වීම වැනි පිළිතුරු

05. 1. අපගේ පව්වලට මිදීම ලබා දීමට
2. කසයෙන් තැලීම, කෙළ ගැසීම, අපහාස කිරීම
3. සිසුන්ගේ පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

06. 1. ජේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන වීමයි
2. කාන්තාවන්ට, පේදුරුතුමාට හා එම්මාවුස් ගමට ගිය ගෝලයන්ට
3. සිසුන්ගේ පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න

II - කොටස ලකුණු 2 x 8 = 16

2 - 6 ප්‍රශ්නය සඳහා

| | | |
|---|---|---|
| (1) | කොටස | ලකුණු (2) |
| (2) | කොටස | ලකුණු (3) |
| (3) | කොටස | ලකුණු (6) |
| | මුළු ලකුණු | ලකුණු (11) |



agaram.lk
Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!